

කාර්ය සාධන වාර්තාව

2024

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
මුද්‍රල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
කොළඹ - 01

2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
වැය ශීර්ෂ අංකය - 244

පටුන

	පිටු අංකය
1. ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය	1
1.1 හැඳින්වීම	1
1.2 ආයතනික දැක්ම, මෙහෙවර, අභිමතාර්ථ සහ අරමුණු	1
1.3 ප්‍රධාන කාර්යයන්	2
1.3.1 වෙළඳ ප්‍රතිපත්ති අංශය	2
1.3.2 පාලන හා මූල්‍ය අංශය	5
1.4 2024 දෙසැම්බර් 31 වන දිනට සංවිධාන සටහන	6
2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම	7
2.1 ප්‍රධාන ජයග්‍රහණ සහ අභියෝග	7
3. 2024 දෙසැම්බර් **31** වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය	8
3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය	8
3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	9
3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය	10
3.4 මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්	11
3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	18
3.6 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගි කරගැනීමේ කාර්ය සාධනය	18
3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	18
3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය - 2024	18
3.9 විගණකාධිපති වාර්තාව	18
4. කාර්ය සාධන දර්ශක	19
5. තිරසර සංවර්ධන අභිමතාර්ථ **(SDGs)** සපුරා ගැනීමේ කාර්ය සාධනය	21
5.1 තිරසර සංවර්ධන අරමුණු	21
6. මානව සම්පත් පැතිකඩ	30
6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය	30
6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම	30
6.3 මානව සම්පත් සංවර්ධනය	30
7. අනුකූලතා වාර්තාව	31

01. ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම වනුයේ ශ්‍රී ලංකා ආර්ථිකයෙහි සහ ජනතාවගේ ශුභසාධනය උදෙසා විදේශ වෙළඳාම, ආයෝජන, දේශීය කර්මාන්ත හා කෘෂි කර්මාන්තය සඳහා පහසුකම් සැලසීමට තිරසාර තීරු බදු ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම යි.

එමෙන්ම ආනයන හා අපනයන රෙගුලාසි, රේගු පරිපාලනය, විදේශ විනිමය නියෝග, සහනදායි පදනම මත මෝටර් රථ ආනයන බලපත්‍ර ක්‍රමය ඇතුළුව තීරු බදු සහන ප්‍රදානය කිරීම්/ ඉවත් කිරීම් හා වෙළඳ ගිවිසුම් යටතේ තීරුබදු ලිහිල්කරණය සම්බන්ධිත ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් ද මෙම දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබේ.

1.2 ආයතනික දැක්ම, මෙහෙවර, අභිමතාර්ථ සහ අරමුණු

දැක්ම

රටේ සමස්ත ජනතාව සඳහා ප්‍රතිලාභ ලැබෙන සංවර්ධනයක් අත්පත් කරගැනීම සඳහා වෙළඳ හා ආයෝජන කටයුතුවල ප්‍රගාමී ප්‍රතිපත්ති ස්ථාපනය කිරීම තහවුරු කිරීම.

මෙහෙවර

රට තුළ සමස්ත ජනතාව සඳහා ප්‍රතිලාභ ලැබෙන සංවර්ධනයක් අත්පත් කරගැනීම සඳහා ජාත්‍යන්තර ආර්ථික ඒකාබද්ධතාවයට ඉඩ සලසන්නා වූ වෙළඳ හා ආයෝජන කටයුතු සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම.

අභිමතාර්ථ

- වෙළඳ ප්‍රවර්ධන සහ කර්මාන්ත හිතකාමී තිරුබදු ක්‍රමයක් පවත්වා ගැනීම.
- වෙළඳාම පහසු කිරීමේ දර්ශකය සඳහා පහසුකම් සැලසීම පිණිස වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ පියවර සම්බන්ධයෙන් ප්‍රතිපත්ති පවත්වා ගෙන යාම.
- වෙළඳ ගිවිසුම් යටතේ තරහකාරී වාසි ලැබෙන පරිද්දෙන් තිරු බදු ක්‍රමය ක්‍රියාත්මක කිරීම.
- රජයේ ආර්ථික හා සමාජීය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බදු සහන ක්‍රියාත්මක කිරීම.
- මෙම කලාපය තුළ සෘජු විදේශ ආයෝජන සඳහා කේන්ද්‍රස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම.

අරමුණු

- වෙළඳ කටයුතු ප්‍රවර්ධනය හා කර්මාන්ත සඳහා හිතකාමී මනා තිරුබදු ක්‍රමයක් ඇති කිරීම.
- ආයෝජන අධෛර්යමත් කරන තිරුබදු සීමා ඉවත් කිරීම.
- අපනයන සැකසුම් සඳහා තාවකාලික ආනයනය කිරීම් (TIEP) යෝජනා ක්‍රමය ශක්තිමත් කිරීම.
- බන්ධිත ගුදම් සම්බන්ධිත ප්‍රතිපත්තිය ශක්තිමත් කිරීම.
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා ප්‍රතිපත්තියක් සැකසීම සඳහා අදාළ පාර්ශවකරුවන් සමඟ සංවාද සංවිධානය කිරීම.
- සේවාලාභී හිතකාමී දත්ත පද්ධතියක් ඔස්සේ අවශ්‍ය තොරතුරු සැපයීම මඟින් ව්‍යවසායකයින්ට සහයෝගය දැක්වීම.
- රාජ්‍ය නිලධාරීන් සඳහා සහනදායී පදනම් මත වාහන ආනයන බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු විධිමත් කිරීම.
- මෙරට වෙළඳ ආර්ථිකයේ අසමමිතික ස්වභාවය තුළ අන්‍යෝන්‍ය ප්‍රතිලාභ මත පදනම් වූ නිදහස් වෙළඳ ගිවිසුම් ප්‍රවර්ධනය කිරීම.
- ගෝලීය අගයදාම වෙළඳාම/කර්මාන්ත සඳහා ප්‍රවේශය සලසන නිදහස් වෙළඳ ගිවිසුම් ප්‍රවර්ධනය කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

1.3.1 වෙළඳ ප්‍රතිපත්ති අංශය

වෙළඳ, කර්මාන්ත, කෘෂි කර්මාන්තය හා නිදහස් වෙළඳ ගිවිසුම්වලට අදාළව තිරුබදු ප්‍රතිපත්තිය සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා සංශෝධනය සම්බන්ධයෙන් වෙළඳ ප්‍රතිපත්ති අංශය වගකීම් දරනු ලැබේ. රේගු ආඥා පනත යටතේ නියෝග ප්‍රකාශයට පත් කිරීම, රේගු හා තිරුබදු ආශ්‍රිත ගැටලුවලට අදාළ අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීම ඇතුළුව රේගු පරිපාලන කටයුතු සම්බන්ධීකරණය කිරීම, මෝටර් වාහන ආනයනය සඳහා තිරුබදු සහන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම හා විවිධ තිරුබදු සහන යෝජනා ක්‍රම යටතේ ආනයනය කළ වාහන අපහරණය සම්බන්ධයෙන් කටයුතු කිරීමේ වගකීම ද මෙම අංශය වෙත පැවරී තිබේ. විදේශ විනිමය පනත යටතේ නියෝග නිකුත් කිරීමේ හා අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධීකරණය, දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංවිධානය (SAARC), සාක් සංවර්ධන අරමුදල සහ ලෝක වෙළඳ සංවිධානය (WTO) සමඟ අදාළ කටයුතු සම්බන්ධීකරණය හා එම සංවිධාන තුළ මෙරට නියෝජනය කිරීම සහ ආනයන හා අපනයන පාලන පනත යටතේ රෙගුලාසි හා නියමයන් නිකුත් කිරීමේ දී අදාළ ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම ද මෙම දෙපාර්තමේන්තුවට පැවරී තිබේ.
මෙම අංශය මඟින් ඉටුවෙන ප්‍රධාන කාර්යයන් පහත විස්තරාත්මකව දක්වා ඇත;

වෙළඳ ප්‍රතිපත්තිය

i. මෝටර් වාහන ආනයන ප්‍රතිපත්තිය කළමනාකරණය
ii. වෙළඳ කටයුතුවලට අදාළ ජාතික හා අන්තර්ජාතික සංවිධාන සමඟ සම්බන්ධීකරණය
iii. පාර්ශවකරුවන් විසින් ඉදිරිපත් කරන වෙළඳ කටයුතු ආශ්‍රිත ගැටලු විසඳීම
iv. අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා වෙළඳ ප්‍රතිපත්ති පත්‍රිකා සකස් කිරීම
v. වෙළඳ කටයුතු ආශ්‍රිත අධිකරණ නඩු කටයුතු සඳහා පිළිතුරු සැපයීම
vi. වෙළඳ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශ/ නිරීක්ෂණ සහ මතයන් ඉදිරිපත් කිරීම
vii. වෙළඳ /තීරු බදු සම්බන්ධිත අයවැය යෝජනා සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම
viii. රේගු ආඥා පනත යටතේ වන නියමයන් ප්‍රකාශයට පත් කිරීම සඳහා පහසුකම් සැලසීම
ix. විදේශ විනිමය පනත යටතේ නියෝග ප්‍රකාශයට පත් කිරීම / නියමයන් නිකුත් කිරීම සඳහා පහසුකම් සැලසීම
x. තක්සේරු කිරීම් ද ඇතුළුව රේගු කටයුතුවලට අදාළ අභියාචනා සමාලෝචනය කිරීම
xi. රේගු පරිපාලනය සම්බන්ධිත විගණන වාර්තා සමාලෝචනය
xii. අපනයන සැකසුම් සඳහා තාවකාලික ආනයනය කිරීම් යෝජනා ක්‍රමවල ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳ සම්බන්ධීකරණය
xiii. බන්ධිත ගුදම් පහසුකම්වල ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධීකරණය
xiv. ආනයන තාර්කිකකරණය පිළිබඳ ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධීකරණය
xv. විදේශ විනිමය පනත යටතේ ලැබෙන අභියාචනා සමාලෝචනය කිරීම
xvi. ආනයන හා අපනයන පාලන පනත යටතේ ලැබෙන අභියාචනා සමාලෝචනය කිරීම
xvii. රේගු පරිපාලනය සම්බන්ධිත ද්විපාර්ශ්වික ගිවිසුම් සම්බන්ධීකරණය
xviii. වෙළඳ කටයුතු සඳහා පහසුකම් සැලසීම ඇතුළුව ලෝක වෙළඳ සංවිධානය ආශ්‍රිත කරුණු සම්බන්ධීකරණය

තීරුබදු ප්‍රතිපත්තිය

i. රේගු ආඥාපනතේ 19 (අ) වගන්තිය යටතේ ප්‍රදානය කරන තීරුබදු ඉවත් කිරීමේ කටයුතු සම්බන්ධීකරණය
ii. ආදායම් සංරක්ෂණ ආඥා ප්‍රකාශයට පත් කිරීම
iii. තීරුබදු විෂමතා ආශ්‍රිතව ඉදිරිපත් කරන ගැටලු විසඳීම
iv. නව ජාතික උප බෙදුම් රේගු සංකේතාංක කළමනාකරණය
v. සංයෝජිත වර්ගීකරණ සංකේතාංකවලට අනුකූලත්වය හා අනිස්ථාපනය කිරීම
vi. තීරුබදු ප්‍රතිපත්තිය ආශ්‍රිත ගැටලු හා විකල්ප විශ්ලේෂණය කිරීම
vii. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත ක්‍රියාත්මක කිරීම

viii. නිරූබදු ප්‍රතිපත්තිය සමාලෝචනය හා යාවත්කාලීන කිරීම

ix. නිරූබදු ප්‍රතිපත්තිය සම්බන්ධිත පාර්ලිමේන්තු කටයුතු

x. නිරූබදු කටයුතු හා සම්බන්ධ ජාතික හා අන්තර්ජාතික ආයතන සමඟ සම්බන්ධීකරණය

xi. පාර්ශවකරුවන් විසින් ඉදිරිපත් කරන නිරූබදු ප්‍රතිපත්තිය ආශ්‍රිත ගැටලු විසඳීම

xii. අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා නිරූබදු ප්‍රතිපත්ති පිළිබඳ පත්‍රිකා සැකසීම

xiii. නිරූබදු ප්‍රතිපත්තිය සම්බන්ධිත අධිකරණ නඩු කටයුතු සඳහා වගඋත්තර සකස් කිරීම

නිදහස් වෙළඳ ගිවිසුම්

i. නිදහස් වෙළඳ ගිවිසුම්වලින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය කෙරෙහි වන බලපෑම් විශ්ලේෂණය කිරීම

ii. ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ ගිවිසුම්වලට අනුකූලව වෙළඳ ප්‍රතිපත්තිය සමාලෝචනය හා යාවත්කාලීන කිරීම

iii. පහත සඳහන් ගිවිසුම් සම්බන්ධයෙන් නිරූබදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම:

- ඉන්දියා - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)
- පකිස්තාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)
- දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)
- ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA)
- ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම (SLSFTA)
- බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගිතාවය සඳහා වූ බහුපාර්ශවීය ගිවිසුම (BIMSTEC)
- යෝජිත චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (CSFTA), සහ
- ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුම (ETCA)

විශේෂ යෝජනා ව්‍යාපෘති

i. රාජ්‍ය නිලධාරීන් සඳහා සහනදායී පදනම් මත මෝටර්රථ ලබාගැනීම සඳහා වන යෝජනා ක්‍රමය

ii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 යටතේ නිකුත් කරනු ලබන බලපත්‍ර

iii. විදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 210 යටතේ, රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන් සඳහා සහනදායී පදනම් මත මෝටර් රථ ආනයනය කිරීමේ යෝජනා ක්‍රමය

iv. විවිධ නිරූ බදු සහන යෝජනා ක්‍රම යටතේ ආනයනය කරනු ලැබූ මෝටර් රථ අපහරණය කිරීම

v. රේගු ආඥා පනත යටතේ රේගු බදු ඉවත් කිරීම් ප්‍රදානය කිරීම

vi. අපනයන සැකසුම් යෝජනා ක්‍රමය (TIEP) යටතේ ආනයනය කිරීම්

vii. රේගු බන්ධිත ගුදම් පහසුකම් ලබාදීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය අනුමැතිය ලබාදීම සම්බන්ධීකරණය

viii. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සාර්ක් සංවර්ධන අරමුදලෙහි ප්‍රතිපාර්ශවීය ආයතනය ලෙස කටයුතු කිරීම ඇතුළුව සාර්ක් සංවර්ධන අරමුදලේ කටයුතු

ix. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කරුණු සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය අනුමත කිරීම සහ අභියාචනා කටයුතු සම්බන්ධීකරණය කිරීම


x. ජාතික තනි කවුළුව ව්‍යාපෘතිය (NSWP)

1.3.2 පාලන සහ මූල්‍ය අංශය

මානව සම්පත්, වත්කම් හා මූල්‍ය සම්පත් කළමනාකරණය සඳහා පාලන හා මූල්‍ය අංශය වගකීම දරනු ලැබේ. දෙපාර්තමේන්තුව තුළ නිලධාරීන්ගේ ස්ථානගත කිරීම්, ධාරිතා සංවර්ධන හා ශුභසාධන කටයුතු මානව සම්පත් කළමනාකරණය යටතට ඇතුළත් වේ. භෞතික හා මූල්‍ය සම්පත් අත්පත් කරගැනීම, නඩත්තු කිරීම හා වාර්තා පවත්වා ගැනීම භෞතික හා මූල්‍ය සම්පත් කළමනාකරණය යටතේ ආවරණය වේ.

මීට අමතරව, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, කාර්යසාධන වාර්තා, වාර්ෂික මූල්‍ය වාර්තා සැකසීම හා විගණන ගැටලු සම්බන්ධිත පසුවිපරම් කටයුතු පාලන හා මූල්‍ය අංශයේ විෂය පථයට ඇතුළත් වේ.

1.4 2024 දෙසැම්බර් 31 දිනට සංවිධාන ව්‍යුහය



පරි.නි. : පරිපාලන නිලධාරී
තො.ස.තා.නි : තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී
ප්‍ර.ක.සේ.නි. : ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
සං.නි. : සංවර්ධන නිලධාරී
ක.සේ.නි. : කළමනාකරණ සේවා නිලධාරී
ක.කා.ස. : කාර්යාල කාර්ය සහායක

02. ප්‍රගතිය සහ ඉදිරි දැක්ම

2.1 ප්‍රධාන ජයග්‍රහණ සහ අභියෝග

මහා භාණ්ඩාගාරය යන ප්‍රවේශයෙන් සැලකිමේ දී, වෙළඳ සහ ආයෝජන කටයුතුවලට අදාළ ප්‍රතිපත්තිමය කරුණු සඳහා මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ පහසුකම් සලස්වන දෙපාර්තමේන්තුව වනුයේ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව යි.

භාණ්ඩාගාර ලේකම්වරයාගේ මහ පෙන්වීම සහ නියෝග යටතේ 2024 මූල්‍ය වර්ෂය තුළ දී මෙම දෙපාර්තමේන්තුව විසින් ආර්ථික ස්ථායිකරණය, යථා තත්ත්වයට පත්වීම හා ආර්ථික වර්ධනය උදෙසා වන රජයේ ක්‍රියාමාර්ගවලට අදාළව විවිධ පියවර ගන්නා ලදී.

විනිවිදභාවයකින් යුතු, සංගත, පුරෝකතනය කළ හැකි, සරල සහ පහසුකම් සලස්වන්නා වූ තීරු බදු ක්‍රමයක් සහතික කිරීම උදෙසා, අමාත්‍ය මණ්ඩලය විසින් ජාතික තීරුබදු ප්‍රතිපත්ති රාමුව අනුමත කරන ලද අතර එකී ප්‍රතිපත්තියේ අන්තර්ගත නිර්දේශිත ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු සිදුකරනු ලැබේ.

නීත්‍යානුකූල වෙළඳ කටයුතු සඳහා පහසුකම් සැලසීමේ ප්‍රධාන යාන්ත්‍රණයක් වශයෙන් මූලික පාර්ශවකරුවන් සහයෝගිතාවයෙන් වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළ ක්‍රියාමාර්ග වර්ෂය තුළ ගනු ලැබීය.

ආර්ථික ස්ථායිකරණය, යථා තත්ත්වයට පත්වීම හා ආර්ථික වර්ධනය සඳහා රුකුලක් වන විදේශ විනිමය ප්‍රවාහ සහ සම්බන්ධිත ආයෝජන යෝජනා කළමනාකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ අනෙකුත් අදාළ අධිකාරීන්ගේ මූලාරම්භයන් සමඟින් අවශ්‍ය පියවර ගන්නා ලදී.

එළඹෙන වසරවල දී මෙම දෙපාර්තමේන්තුව අභිමුව පවතින අභියෝගය වනුයේ ණය ප්‍රවාහ ජනිත නොවන ආකාරයෙන් රට තුළට ගලා එන විදේශ විනිමය ප්‍රවාහ මූලික කරගත් වෙනත් රටවල් අභිබවා යන ආර්ථික වර්ධනයක් සමඟින් මෙරට තරඟකාරී ආර්ථිකයක් බවට පරිවර්තනය කිරීම උදෙසා වන ප්‍රයත්නයන් සමඟ අනුකූලවන පරිදි දෙපාර්තමේන්තු විෂය පථය තුළ නිශ්චිත වෙළඳ සහ ආයෝජන ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීම යි.

ගරු අමාත්‍යතුමා, ගරු මුදල් රාජ්‍ය අමාත්‍යවරු, භාණ්ඩාගාර ලේකම්, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරු, අනෙකුත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවල අධ්‍යක්ෂ ජනරාල්වරු, රේගු අධ්‍යක්ෂ ජනරාල්, ආනයන හා අපනයන පාලක ජනරාල්, මෙම දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කරන අදාළ ආයතනවල නිලධාරීන්, පුද්ගලික අංශයේ පාර්ශවකරුවන් සහ මෙම දෙපාර්තමේන්තුවේ සහෝදර නිලධාරීන් යන සියලු දෙනාට ඔවුන්ගේ උපදෙස්, මහ පෙන්වීම සහ සහාය ලබාදීම සම්බන්ධයෙන් මාගේ කෘතඥතාවය පළකිරීම සඳහා මෙය අවස්ථාවක් කරගනිමි.

එම්.කේ.පී. කුමාර
අධ්‍යක්ෂ ජනරාල් - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
2025 පෙබරවාරි 27 වැනි දින

03. 2024 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒකීය-එල්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024		සටහන	2024	2023	
රු.			රු.	රු.	
-	ආදායම් ලැබීම්		-		
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	උපලේ-1
-	ජාත්‍යන්තර වෙළෙඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අලාභ		100,671,000	79,217,400	උපලේ-3
-	නැන්පතු		1,244,086	416,053	උපලේ-4
-	අන්තිකාරම් ගිණුම්		4,539,537	4,974,892	උපලේ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		106,454,623	84,608,345	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම්				
-	නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		106,454,623	84,608,345	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම්				
	නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		106,454,623	84,608,345	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
57,561,161	වැටුප්, වේතන සහ අනෙකුත් රැස්වන ප්‍රතිලාභ	5	57,373,681	50,587,831	
34,867,219	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	27,790,566	31,476,289	උපලේ-2(ii)
2,220,000	සහනාධාර, ප්‍රදාන සහ උපැකිරීම්	7	685,844	523,790	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
94,648,380	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		85,850,091	82,587,910	
	මූලධන වියදම්				
	ස්ථාවර වත්කම් පුනරුත්ථාපනය හා				
-	ඇඩිදියුණු කිරීම්	10	-	-	
4,921,620	ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම්	11	4,488,220	-	
-	ප්‍රාග්ධන උපැකිරීම්	12	-	-	උපලේ-2(ii)
-	ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම්	13	958,250	-	
1,500,000	ගැනියා වර්ධනය	14	-	-	
200,000,000	වෙනත් ස්ථාවර වියදම්	15	12,052,361	-	
206,421,620	මුළු මූලධන වියදම් (උ)		17,498,831	-	
	නැන්පතු ගෙවීම්		1,244,086	416,053	උපලේ-4
	අන්තිකාරම් ගෙවීම්		6,081,910	4,094,212	උපලේ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		7,325,996	4,510,265	
	මුළු වියදම් ඔ = (ඊ+උ+ඌ)		110,674,919	87,098,175	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-ඔ)		(4,220,295)	(2,489,830)	
	අඕම ඇරඵුම් ප්‍රකාශනය අනුව ශේෂය		(4,220,295)	(2,489,830)	උපලේ-7
	දෙසැම්බර් 31 දිනට අඕම ශේෂය				උපලේ-3
			(4,220,295)	(2,489,830)	

1

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-9

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	2024	2023
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියන හා උපකරණ	ඒසිඒ-6	65,532,652	68,649,052
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	8,849,634	7,307,262
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		74,382,286	75,956,314
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		8,849,634	7,307,262
දේපළ පිරියන හා උපකරණ සංචිතය		65,532,652	68,649,052
නුදී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(ඕ)		
ප්‍රංශම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	-	-
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		74,382,286	75,956,314

පිටු අංක 01 සිට 23 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් නොරතුරු සහ ඇතුණුම් පිටු අංක 24 සිට 32 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුම්මෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් කාර්යාංශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව පිළියෙළ කර ඇත. ඉහත අවසන් ගිණුම්මෙහි සඳහන් සංඛ්‍යා, මෙම අදාළ ගිණුම් සංගහන් හා අනෙකුත් ගිණුම් නොරතුරු භාණ්ඩාගාර ගිණුම් ඔපාත් සමඟ සැසඳීම් කර ඇති බවත් ඒවා එම සංඛ්‍යා සමඟ ඒකඟ වන බවත් මෙයින් සහතික කරමි.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් විවර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධතියේ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට පරීක්ෂා වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමි.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මූල්‍ය)/ කොටයාරීස් (ෆැදර්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 2025.02.28	දිනය : 2025.02.21	දිනය : 2025.02.20
කේ.එම්.මහින්ද සිරිවර්ධන මහා භාණ්ඩාගාරයේ සහ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් මුදල් අමාත්‍යාංශය කොළඹ 01.	එම්. කේ. ප්‍රදීප් කුමාර අධ්‍යක්ෂ ජනරාල් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව මහ භාණ්ඩාගාරය කොළඹ 01	ඩඩි.ඒ. දිමුතු වීරේසිංහ ගණකාධිකාර අයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරය කොළඹ 01.

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසිඒ-බී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	2024 රු.	2023 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩයුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	2,933,530	2,540,973
අලුත් ලැබීම්	100,671,000	79,217,400
අන්තිකාරම් අයකර ගැනීම්	5,141,526	5,292,503
තැන්පතු ලැබීම්	1,244,086	416,053
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**109,990,142**	**87,466,929**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	84,787,822	81,947,920
සඟනාගාර සහ මාරුකිරීම්	353,054	523,790
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	24,439	184,954
ආහාරාගාරයට පියවන ලද අලුත්	-	-
අන්තිකාරම් ගෙවීම්	6,081,910	1,094,212
තැන්පතු ගෙවීම්	1,244,086	416,053
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**92,491,311**	**87,466,929**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**17,498,831**	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
ගිණුකළු ඉවත්වීමේ ප්‍රතිපාදන හා හෞනික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්	17,498,831	-
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**17,498,831**	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(17,498,831)**	-
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

ඇමුණුම - (i)

(මු.රෙ. 106 හා මූ.රෙ. 113 යටතේ වන පාඩු)

වියදම් ශීර්ෂ අංකය: 244 අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය : I - මෙහෙයුම් ක්‍රියාකාරකම්

(i) වර්ෂය තුළ අලාභ අයකර ගැනීම/නහාතැරීම/අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

අගය		සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු 25,000.00	අඩු	1	23,000
රු 25,000.01	වැඩි	1	101,350
එකතුව		2	124,350

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1. CAF 8338 දරණ මෝටර් රථය අනතුරකට ලක්වීම	1	23,000
2. CAF 8338 දරණ මෝටර් රථය අනතුරකට ලක්වීම	1	101,350
3	-	-
4	-	-
එකතුව	2	124,350

(ii) නවදුරටත් අයකර ගැනීමට හෝ නහා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශනය

අගය		සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු 25,000.00	අඩු	-	-
රු 25,000.01	වැඩි	-	-
එකතුව		-	-

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1	-	-
2	-	-
3	-	-
4	-	-
එකතුව	-	-

(ii) අනුව කාල විශ්ලේෂණය

වසර 5 ට අඩු	සිද්ධි සංඛ්‍යාව	-
	ගණන	රු
වසර 5-10	සිද්ධි සංඛ්‍යාව	-
	ගණන	රු
වසර 10 ට වැඩි	සිද්ධි සංඛ්‍යාව	-
	ගණන	රු

යටහන - වැය විෂය 1701 යටතේ වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී ගිණුම්ගත කිරීමට අපේක්ෂිත මූ.රෙ. 106 යටතේ වන හානි හා මූ.රෙ 113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු ය.

ප්‍රධාන ගුලං නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී
වෙළඳ (මෙදෙ) වෙළඳාමීස් (මෙදෙ)
දිනය : 2025.02./20

* මෙය වාර්තාකරණ වර්ෂයෙන් පසුව වාර්තාවලට අදාළ වෙනසකම් වෙනුවෙන් වෙළඳාමීස් විසින් වාර්තාවක් සූදානම් කළ යුතු ය.

ඩබ්.ඒ. දීමුතු විජේසිංහ
ගණකාධිකාරී
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

ඇමුණුම -(ii)

පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය : 244 අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය: I - මෙහෙයුම් ක්‍රියාකාරකම්

1 වර්ෂය තුළ සිදුවූ මු.රෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

	අගය		ගිද්දි සංඛ්‍යාව	වටිනාකම (රු)
(i)	රු. 25,000.00 අඩු		1	23,000
(ii)	රු. 25,000.01 වැඩි		1	101,350
	එකතුව		2	124,350

2 වර්ෂය තුළ මු.රෙ. 109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශනය

අලාභයේ ස්වභාවය	ආරම්භක කපා නොහල ශේෂය රු.	අලාභයේ වටිනාකම රු.	අයකර ගැනීම් රු.	පොතෙන් කපා හල අගය රු.	කපා නොහල ඉදිරියට ගෙනයන ශේෂය රු.	පොතෙන් කපා හැරීම් සඳහා වූ අනුමැතියේ යොමු අංකය
1 -	-	-	-	-	-	-
2 -	-	-	-	-	-	-
3 -	-	-	-	-	-	-
4 -	-	-	-	-	-	-
5 -	-	-	-	-	-	-
6 -	-	-	-	-	-	-
එකතුව						

සටහන - සටහන (i) හි ඇතුළත් ගිණුම්ගත කළ යුතු පාඩු හා අත්හැරීම් හැර මු.රෙ. 109 යටතේ වන අනෙකුත් පාඩු හා අත්හැරීම් පමණක් මෙම ආකෘතියේ ඇතුළත් කළ යුතු ය.

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි
අධ්‍යක්ෂ (මූල්‍ය) / කොමිසාරිස් (මූල්‍ය)
දිනය : 2025.02./20

ඩබ්.ඒ. දිමුතු විජේසිංහ
අධිකාරිධාරී
වෙළඳ හා අපෝහන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
ඒකීය භාණ්ඩාගාරය
කොළඹ 01.

* තම වාර්තාකරණ වර්ෂයේ මෙම වාර්තාවලින් අදාළව කිසිවක් නොමැති අවස්ථාවල හිස වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

Cumulative Commitment/ Liability Report for the Year - 2024

To
(244)

From
Director General, ,
Department of State Accounts, ,
General Treasury, Colombo1. .

Printed by bhagaya
New Table No :SA-92
Old Table No :--
Report Date 2/20/2025 11:16:50 AM



Nature	Commit_No	Date	To_whom	Vote	Commitment	Commit_bal	L_Date	Liability_amt	Revised_Lia	Paid	Liability_Bal	Reported_B
Govt	P2501/24	31 Jan 2025	D.T. Sutharshan	244-1-1-0-1409-140-P	14,385.00	0.00	31 Jan 2025	14,385.00	0.00	0.00	14,385.00	244
Govt	P2501/25	31 Jan 2025	Government Printer	244-1-1-0-1409-140-P	16,699.95	0.00	31 Jan 2025	16,699.95	0.00	0.00	16,699.95	244
Govt	P2501/26	31 Jan 2025	M.H.M.F. Rahman	244-1-1-0-1409-140-P	10,642.50	0.00	31 Jan 2025	10,642.50	0.00	0.00	10,642.50	244
Govt	P2501/13*1	31 Dec 2024	Express Environmental Services (Pvt) Ltd	244-1-1-0-1409-140-P	74,093.97	0.00	31 Dec 2024	74,093.97	0.00	0.00	74,093.97	244
Govt	P2501/20	31 Dec 2024	Secretary - Ministry of Finance - Planning and Economic Development	244-1-1-0-1402-P	61,686.36	0.00	31 Dec 2024	61,686.36	0.00	0.00	61,686.36	244
Govt	P2501/21	31 Dec 2024	R. N. M. Advertising	244-1-1-0-1402-P	8,700.00	0.00	31 Dec 2024	8,700.00	0.00	0.00	8,700.00	244

This is a computer-generated document. No signature is required.
Report Generated by the new CIGAS Web Application--Developed by S.Tharshan -Director, Dept of State Accounts.

ඇමුණුම - (iv)

බැරකම් පිළිබඳ ප්‍රකාශනය - (i)

මු.රෙ.94 (2) සහ (3) ප්‍රකාරව බැරකම්වලට එළඹෙන ලද බැඳීම් ප්‍රකාශනය

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය: 244
වැඩසටහන් අංකය හා නාමය: 1 - මෙහෙයුම් ක්‍රියාකාරකම්

ණුද්ගලයාගේ/ආයතනයේ නම	බැඳීම් පිළිබඳ විස්තරය	ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය ශීර්ෂ සංකේතය	ලිඛිතකරණ සංකේතය	මු.රෙ. 94(2) ඒ සඳහන් ප්‍රතිපාදන අනුව ඵළඹිය හැකි උපරිම බැඳීම් සීමාව (රු.)	මු.රෙ. 94(3) අනුව මුල සිටීවිය ඇස්තමේන්තුව (රු.)	බැඳීම් හා බැරකම් වර්ගීකරණ (රු.)
1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු								
-		-	-	-	-	-	-	-
එකතුව								-
2. ආයතන පාලිත/ස්වයංපාලිත ආයතන								
-		-	-	-	-	-	-	-
එකතුව								-
3. ඵළඹෙන් (පෞද්ගලික අංශය)								
කාර්යාල නිලධාරීන්	දෙනියාල	1	0	1002	11	441.000		77.694
කාර්යාල නිලධාරීන්	වද්ගිය ගවුන් වියදම	1	0	1101	11	69.000		20.900
කාර්යාල නිලධාරීන්	1/3 දිවෙනාව	1	0	1003 / 1002	11	9.850.000		425.300
එකතුව								523.894
මුළු එකතුව								523.894
						10,360,000		

ප්‍රාදේශීය ලේකම් ප්‍රධාන ගණකාධිකාරී
වැටුප් (සැලැස්) කොළඹ 05
දිනය : 2025.02.20

ඩබ්.ඒ. දිමුතු වීරසිංහ
මහතාවිටව
බලධාරී හා ආයෝජන ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව
ඉහළ මාළිගාවත්ත
කොළඹ 03

ඇමුණුම - (v)

බැරකම් පිළිබඳ ප්‍රකාශනය - (ii)

මු.රෙ.215 (3) (ආ) සහ (ඇ) ප්‍රකාරව තැන්පත් ගිණුමට මාරු කරන ලද ප්‍රතිපාදන

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය: 244
වැඩසටහන් අංකය හා නාමය: 1 - මෙහෙයුම් ක්‍රියාකාරකම්

පුද්ගලයාගේ/ආයතනයේ නම* (ප්‍රතිපාදන මාරු කරන බිම් පදනාගෙන තිබිය යුතුය)	විගණිම ඉලිබඳ විස්තරය	ණයවර ලිපි අංක ආදිය	ප්‍රතිපාදන මාරු කරනු ලැබුවේ කුමන වැය ශීර්ෂයකින්ද				තැන්පතු ගිණුම් අංකය	මාරුකරන ලද මුදල් රු.
			ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂය සංකේතය	මුල්‍යකරණ සංකේතය		
1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු	ඳෙයාල නොවේ							XX
								XX
එකතුව								
2. රාජ්‍ය සංස්ථා /විසඳස්ථාපිත ආඥාදාල								XX
								XX
එකතුව								
3. වෙනත් (ඉහත්දගලින අංශය)								XX
								XX
එකතුව								
මුළු එකතුව								

ප්‍රධාන ගණ්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී
වෙනත් (සඳහන්) කොට්ඨාසික (සඳහන්)
දිනය : 2025.02/20

ඩබ්.ඒ. දිලුනු වෙදිසිංහ
නිවාඩුවෙන්
වෙළඳ හා අපෝහක ප්‍රතිපත්ති අදහස්කරුවරුන්
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

* නම් වාර්තාකරණ ආයතනයට අදාළ නම් ඉවතින් ආනාවිය භාවිත කළ යුතු ය.

අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශනය

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

වියදම් ශීර්ෂ අංකය: 244

වැඩසටහන් අංකය හා නාමය: I - මෙහෙයුම් ක්‍රියාකාරකම්

දිනය	වවුචර් අංකය	ආදායකයාගේ නම	ගෙවීමේ ස්වභාවය	ගණන (රු)
-	-	-	-	-

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි ප්‍රධාන ගණකාධිකාරි
අධ්‍යක්ෂ (මුදල්) කොමිසාරිස (මුදල්)
දිනය : 2025.02.20

ඩබ්.ඒ. දිමුතු විජේසිංහ
මහාධිකාරී
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
ඊජිප්ත මාවතය
කොළඹ 01.

* නව ව්‍යාපෘතිවල ආයතනයේ යම්කිසි ව්‍යාපෘතියකට අදාළව ගෙවනු නොලැබූ අවස්ථාවල හිස ව්‍යාපෘතිය ඉදිරිපත් කළ යුතු ය.

2015/10/23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් වකුලේඛ අංක 2015/03 හි උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ 2024.12.31 දිනට තත්ත්ව වාර්තාව

වියදම් ශීර්ෂ අංකය: 244 අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: වෙළඳ හා ආයෝජන ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව

අනු අංකය	බැංකුවේ නම	ගිණුම් අංකය	2024.12.31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය (රු.)	2024.12.31 දිනට මුදල් පොත අනුව ශේෂය (රු.)	2024.12.31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇනොක්)	අවසාන වරට බැංකු සැසඳුම් සකස් කළ මාසය
1	මහජන බැංකුව	14100169026611	6,191,583	-	-	දෙසැම්බර්

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට තහවුරු කරමි.

.....

ප්‍රධාන ගුලෑ නිලධාරි ප්‍රධාන ගණකාධිකාරි
අධ්‍යක්ෂ (මුදල්) නොමෙසාරිය (මුදල්)
දිනය : 2025.02./20

ඩබ්.ඒ. දිමුතු විජේසිංහ
ගණකාධිකාරී
වෙළඳ හා ආයෝජන ප්‍රවර්ධනය අමාත්‍යාංශය
අංක 01.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය **-2024** රු.000

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ඇස්තමේන්තුවේ ලෙස %
-	-	-	-	-	-

3.6 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්යසාධනය **-2024** රු. **000**

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන ලබාදුන් අවසාන ප්‍රතිපාදනයේ %ක් ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසන් ප්‍රතිපාදනය		
පුනරාවර්තන	92,605	94,648	85,850	91
ප්‍රාග්ධන	204,000	206,422	17,499	8.6

3.7 මු.රෙ. **208** ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන රු. **000**

අනු අංකය	ප්‍රතිපාදනය කවර අමාත්‍යාංශයකින්/ දෙපාර්තමේන්තුවකින් ලැබුනේ ද යන වග	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදනය		තත්‍ය වියදම	උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන , ලබාදුන් අවසාන ප්‍රතිපාදනයේ % ක් ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		
-	-	-	-	-	-	-

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය රු. **000**

වත්කම් ක්ෂේත්‍රය	ක්ෂේත්‍ර විස්තරය	2024 12.31. දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම් කිරීමට නියමිත	2024.12.31 දිනට ප්‍රගතිය වාර්තා කිරීම
61121	ප්‍රවාහන උපකරණ	-	27,080	-	100%
61122	යන්ත්‍රෝපකරණ හා උපකරණ	-	36,395	-	100%
61133	අනෙකුත් (අස්පෘශ්‍ය)	-	2,058	-	100%

3.9 විගණන වාර්තාව (කරුණාකර ඇමුණුම් බලන්න)

04. කාර්යසාධන දර්ශක - 2024

අංකය	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		90 - 100%	75 - 89%	50 - 74%
1	ද්වී පාර්ශ්වික, පාර්ශව දෙකකට වැඩි නමුත් බහුපාර්ශ්වික නොවන, සහ බහු පාර්ශ්වික වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීමේ කටයුතු ප්‍රතිශතාත්මක ලෙස			
1.1	ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම (SLSFTA)	√		
1.2	නායිලන්ත - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම	√		
1.3	අනෙකුත් නිදහස් වෙළඳ ගිවිසුම් සම්බන්ධයෙන් පසුපෙවුම් කටයුතු	√		
2	යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම් සඳහා පහසුකම් සැලසීමේ කටයුතු ප්‍රතිශතාත්මක ලෙස			
2.1	යෝජිත චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (කටයුතු තාවකාලිකව නවත්වා තිබේ)	මෙම වර්ෂය තුළ දී ගැටලු කිසිවක් පැනනැඟී නොමැත.		
2.2	යෝජිත බංග්ලාදේශ - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (BSPTA)	√		
2.3	යෝජිත ශ්‍රී ලංකා - ඉන්දුනීසියා වරණීය වෙළඳ ගිවිසුම	√		
2.4	ඉන්දියාව සමඟ ඵලදායීමට නියමිත යෝජිත ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුම (ETCA)	√		
2.5	යෝජිත ශ්‍රී ලංකා - මැලේසියා නිදහස් වෙළඳ ගිවිසුම (යෝජිත ශ්‍රී ලංකා - මැලේසියා නිදහස් වෙළඳ ගිවිසුම සම්බන්ධයෙන් එකඟතා ඇතිකර ගැනීම ආරම්භ කිරීම සඳහා 2024.06.11 දාතමින් යුතුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. 2024 වර්ෂය සඳහා වූ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මේ මෙම කරුණ අන්තර්ගත වී නොමැති නමුදු එකී වර්ෂයේ 4 වැනි කාර්තුවට අදාළ ප්‍රගතියේ මේ කරුණ සඳහන් වී තිබේ).	මෙම වර්ෂය තුළ දී ගැටලු කිසිවක් පැනනැඟී නොමැත.		
3	ජාතික සංවර්ධනය සඳහා තිරුබදු ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීමේ කටයුතු ප්‍රතිශතාත්මක ලෙස			
3.1	- රේගු ආනයන බද්ද සංශෝධනය සම්බන්ධයෙන් වන ඉල්ලීම්වලට - සංයෝජිත වර්ගීකරණ සංකේතාංකවල නව ජාතික උපබෙදුම් ඇති කිරීම සඳහා වන ඉල්ලීම්වලට අදාළව ආදායම් සංරක්ෂණ ආඥා ඇතුළත් ගැසට් නිවේදන නිකුත් කිරීම	√ √		
3.2	විශේෂ වෙළඳ භාණ්ඩ බද්දට අදාළ ගැසට් නිවේදන නිකුත් කිරීම	√		
3.3	රේගු ආඥා පනත යටතේ ගැසට් නිවේදන නිකුත් කිරීම (අධිභාරය පැනවීම්)	√		
3.4	සෙස් ගැසට් නිවේදන නිකුත් කිරීම	√		
4	ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාම පහසුකරණය කිරීමේ ගිවිසුමෙහි (WTO – TFA) බැඳීම් සහ වෙළඳාම පහසුකරණය කිරීමේ ජාතික කමිටුවේ (NTFC) කටයුතු	√		
